**ආයුර්වේදය**

# ආයුර්වේදයේ එන ශල්‍ය වෛද්‍ය ක්‍රම

කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්ව විද්‍යාලය

**වෛද්‍ය ඩී. පී. ඒ. දිසානායක**


ශල්‍ය වෛද්‍ය ක්‍රම කී පමණින් බොහෝ දෙනාට කල්පනාවට එන්නේ බටහිර වෛද්‍ය ක්‍රමය පමණයි. ආයුර්වේදයේ ශල්‍ය වෛද්‍ය ක්‍රමයක් ඇති බවවත් බොහෝ දෙනා දන්නේ නැහැ. එහෙත් දියුණු ශල්‍ය වෛද්‍ය ක්‍රමයක් ආයුර්වේදයේ පැවතුණා. ශල්‍ය වෛද්‍ය ක්‍රමයේ පියා ලෙස ආයුර්වේදයේ දී සැලකෙන්නේ සුශ්‍රැත ආචාර්යවරයා යි.

ආයුර්වේදයේ අංග අටක් තිබෙනව. ඉන් මූලිකම තැනක් ශල්‍ය අංශයට හිමිවෙනවා. ඉන් කාය චිකිත්සා අංශයේ චරක ආචාර්යත් ශල්‍ය අංශයට සුශ්‍රැතත් ප්‍රධාන වනවා.

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ශල්‍ය හා ශාලාක්‍ය යන අංශ දෙකම එකම දෙපාර්තමේන්තුවකට අයත් වෙනවා. ශාලාක්‍ය යනු සංස්කෘත බසෙන් උගුර කණ නාසය පිළිබඳ රෝගවලට අදාළ ප්‍රතිකාර විධියි. තවත් විදිහකට කිවහොත් දසරුවෙන් උඩ හැදෙන රෝගවලට අදාළ ප්‍රතිකාර විධි යි.

ආයුර්වේදයේ ශල්‍යක්‍රමවල විශේෂත්වය කුමක් ද?

බටහිර ශල්‍යක්‍රමවල ඇත්තේ සැතක් යොදගෙන කරන ක්‍රියාවන්. ආයුර්වේදයේත් ඒවා අඩංගු වෙනවා. එහෙත් ඊට අමතරව රක්ත මෝක්ෂණය (ලේ හැරීම) වැනිදේ කෙරෙනවා. එහිදී කුඩැල්ලන් හා අං ලබු කබල්, බෝතල් වැනි දේ යොද ගන්නවා. ඒ වගේම ක්ෂාර යොදගෙන කරන ප්‍රතිකාරත් තිබෙනවා. අයුර්වේද ක්‍රමයේ පමණයි ශල්‍ය ක්‍රම සඳහා ක්ෂාර භාවිත වන්නේ. උදහරණ අර්ශස් සඳහා භගන්දර සඳහා, කාලීන ව්‍රණ (කල්ගත වූ තුවාල) ඔඩු ව්‍රණ මේ වැනි රෝගවලට ක්ෂාර බාහිර ප්‍රතිකාර ලෙස පාවිච්චි වෙනව.




**බටහිර ශල්‍යක්‍රමවල ඇත්තේ සැතක් යොදගෙන කරන ක්‍රියාවන්. ආයුර්වේදයේත් ඒවා අඩංගු වෙනවා. එහෙත් ඊට අමතරව රක්ත මෝක්ෂණය (ලේ හැරීම) වැනිදේ කෙරෙනවා. එහිදී කුඩැල්ලන් හා අං ලබු කබල්, බෝතල් වැනි දේ යොද ගන්නවා. ඒ වගේම ක්ෂාර යොදගෙන කරන ප්‍රතිකාරත් තිබෙනවා.**

අභ්‍යන්තර ප්‍රතිකාර ලෙස ක්ෂාර භාවිත වන අවස්ථාද (පානීය ක්ෂාර) තිබෙනවා. උදහරණ - අශ්මරි (මුත්‍ර ගල්) අම්ල පිත්ත (උදරයේ ආම්ලිකතාව)

ආයුර්වේදයේ ශල්‍ය චිකිත්සාවේ තව විශේෂ ප්‍රතිකාර ක්‍රමයක් වන්නේ අග්නිකර්මයි. එහිදී කරන්නේ රත් කර ගත් දෙයකින් (බොත්තම් / උපකරණ) පිළිස්සීමයි. මෙය දැනට බටහිර ක්‍රමයේ දී ලේ නැවැත්වීමට පමණක් භාවිත වෙනවා. ආයුර්වේදයේදී ලේ නැවැත්වීමට මෙන් ම ව්‍රණ වලදීත් භාවිත වනව. අර්ශස් රෝගයට ප්‍රතිකාර කිරීමේදීත් අග්නිකර්ම යෙදෙනවා.

ක්ෂාර ක්‍රම හා අග්නි කර්මවල විශේෂත්වය එම ප්‍රතිකාරවලින් පසු රෝගය යළි හටනොගැනීමයි. අර්ශස් අංකුරයක් කැපීම මගින් ප්‍රතිකාර කිරීමත් සිදුවෙනවා. එහෙත් ඉන් නැවත හටගැනීමේ ප්‍රවණතාව වැඩියි. අග්නිකර්ම ප්‍රතිකාරවල ඒ දෙස මතුවන්නේ නැහැ.

ශල්‍ය යන වචනය බිහිව ඇත්තේ "මනඃශරීර බාධකරණි ශල්‍යානි" යන ශ්ලෝක පාඨයෙන්. ඒ ශ්ලෝකයට අනුව සිරුරට හා මනසට පීඩාවක් ඇති කරන යමක් ඇත් ද එය ශල්‍ය යනුවෙන් හඳුන්වනවා. එම ශල්‍යයන් ඉවත් කිරීම තමයි ආයුර්වේද ශල්‍ය ක්‍රමයේදි සිදුවන්නේ. ශල්‍යයන් ලෙස ගැනෙන්නේ පිටතින් ශරීරයට ඇතුළුවන ලෝහ, ලී, විදුරු වැනි ද්‍රව්‍ය පමණක් නොවෙයි සැරව වැනි දෙයක් ද ශල්‍ය ලෙස සැලකෙනව. කුස තුළ මියගිය භ්‍රෑණයක් ද ආයුර්වේදයේ ශල්‍ය ලෙස හැඳින්වෙනවා. ඒ දේවල් ඉවත් කරන්න කරන්නාවූ උපාය මාර්ග තමයි ශල්‍ය ක්‍රමයේදී සිදුවන්නේ.

මෙසේ ඉවත් කරන්න අපට අවශ්‍ය වනව යන්ත්‍ර ශස්ත්‍ර, ක්ෂාර හා අග්නි. ඒවා යොදගෙනයි චිකිත්සාව සිදුකරන්නෙ. යන්ත්‍ර යනු නොකැපෙන මොට ආයුධයි. උද - අඬු වර්ග, අර්ශෝ යන්ත්‍ර, නාඩි යන්ත්‍ර (කැතීටරය වැනි) ශස්ත්‍ර යනු කැපෙන ආයුධ උද - පිහි වැනි දේ. උල් වැනිදේ. එද ආයුර්වේදයේ භාවිත වූවා සිංහ මුඛ යන්ත්‍රය නමින් ශස්ත්‍රයක්. යමක් තදින් අල්ලා ගැනීමටයි එය යෙදවුණේ. අද එය තාක්ෂණිකව දියුණු කොට නවීන ශල්‍ය ක්‍රමවලදීත් භාවිත වෙනවා.

ආයුර්වේදයේ දැඩි අවධානයක් යොමු කෙරෙනව ව්‍රණ චිකිත්සාවට. මෙහිදි නවීන ශල්‍ය වෛද්‍යවරුන් පවා වැඩි අවධානය යොමු නොකරන තුවාලයේ කැලල ඉවත් කිරීම පවා ශල්‍ය වෛද්‍යවරයා ගේ වගකීමක් බව සුශ්‍රැත ආචාර්යවරයා සඳහන් කරනව.

කාලීන ව්‍රණ හා නාඩි ව්‍රණ (ඔඩු වණ) සඳහා තිබෙන ප්‍රතිකාර ක්‍රම ඉතා සාර්ථකයි. ඒ අතරෙන්ද භගන්දර රෝගය සඳහා ඉතා සාර්ථක ප්‍රතිකාර ක්‍රියාත්මක වෙනවා.

භගන්දර යනු භග ප්‍රදේශය දරණය කරනවා යන්නයි. (දරණය යනු ඉරා දැමීමයි) මේ රෝගයේදී සිදුවන්නේ ගුද මග අසල බාහිරයට විවෘත වන ඔඩු වණයක් ඉහළින් ගුද මග තුළටත් විවෘත වනව. මෙය සුව කිරීම ඉතා අපහසු රෝගයක්. ආයුර්වේදයේත්